**හොරණ නගර සභාව**

**------------------------------**

**කළුතර දිස්ත්‍රික්කය**

**----------**

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුලි 31 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට හොරණ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

----------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------ | ---------------------- |
| (i) | තොග වටිනාකම ලෙස භෞතික තොගය ගිණුම්ගත කිරීම වෙනුවට රු.3,936,747 ක් වූ පොත් අගය ගිණුම් ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | ඉදිරියේදී නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කරන බව දන්වමි. |
| (ii) | ඉකුත් වර්ෂ වෙනුවෙන් ගෙවිය යුතු රු.228,429 ක් වූ විශ්‍රාම වැටුප් දායක මුදල ගිණුම් තැබීමේදී ණයහිමි ගිණුමට පමණක් බැර කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (iii) | පොදු පරිපාලන වැඩසටහනෙහි පුද්ගල පඩිනඩි රු.113,632 ක් හා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවීම් රු.13,632 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | භෞතික සැලසුම් හා මංමාවත් වැඩ සටහනෙහි ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු වියදම රු.200,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (v) | සමාලෝචිත වර්ෂයට අදාල වරෙන්තු ගාස්තු ආදායම් රු.177,860 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (vi) | බලපත්‍ර ගාස්තු ආදායම් රු.230,121 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (vii) | සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් ආධාර රු.99,995 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (viii) | සමාලෝචිත වර්ෂයට අදාල කුලි ආදායම රු.307,975 කින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (ix) | සමාලෝචිත වර්ෂයේ ආයුර්වේද බෙහෙත් මිලදී ගැණුම් රු.9,014,813 ක් හා ආයුර්වේද ගබඩා නිකුත් කිරීම් රු.9,010,009 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්
-----------------------

| විගණන නිරීක්ෂණය<br>-------------------- | නිර්දේශය<br>--------------------- | ගණන් දිමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>------------------- |
|---|---|---|
| රු.57,552,551 ක් වූ ගිණුම් විෂයයන් 09 කට අදාළව මූලා ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් හා ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.13,860,851 ක වෙනසක් විය. | අදාල ශේෂ වල වෙනස් කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කල යුතුවේ. | ගිණුම නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ඈ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛන හා උපලේඛන නොමැතිවීම නිසා එකතුව රු.101,516,046 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මුල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුය. | ඉදිරියේදී ලබා දීමට කටයුතු කරන බව දන්වමි. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | රු. | | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | | |
| (i) මුදල් රෙගුලාසි 104 | | ගිලන් රථයට 2018නොවැම්බර් 01 දින සිදු වූ අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. | මෙම අනතුර සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින බැවින් එම තොරතුරු ලබාගන්නා තෙක් පරික්ෂණ වාර්තා ඉදිරිපත් කර නැති බව දන්වමි. |
| (ii) මුදල් රෙගුලාසි 371(ඇ) | 3,761,141 | තත්කාර්ය අත්තිකාරම් පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය | ඉදිරියේදී නිවැරදිව කටයුතු කරමි. |
| (iii) මුදල් රෙගුලාසි 571(1)(2) | - | ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය | කමිටුවක් පත් කර අදාල කටයුතු ඉදිරියේදී සිදු කරමි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 වගන්තිය | - | වාහන 09 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. | ඉන්ධන දහනය සිදු කර ඇති බව දන්වමි. |
| (ඇ) | 2018 දෙසැම්බර් 07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය | 45,800 | ප්‍රචාරක දැන්වීම් පුවරු 07 කින් අයවිය යුතු ගාස්තු අයකර ගෙන නොතිබුණි. | ගැසට් පත්‍රය අනුව කටයුතු කල යුතුය. | මෙතෙක් අයවීම් පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර ඇති බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.33,352,293 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.38,105,742 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නාගරික සංවර්ධන අධිකාරි ජංගම ගිණුමෙහි 2009 සිට පැවත එන රු.99,885 ක ශේෂය ඵලදායි කාර්යයකට යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල මුදල් ඵලදායි කාර්යයකට යොදාගත යුතුය. | 2020 වර්ෂයේදී ඵලදායි කාර්යයක් සඳහා යොදවා ගැනීමට කටයුතු කරමි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 17,310,000 | 17,122,711 | 14,151,134 | 7,002,410 | 17,310,000 | 17,274,634 | 14,797,738 | 5,219,866 |
| (ii) | කුලී | 8,952,100 | 9,120,082 | 6,788,048 | 2,993,538 | 8,952,100 | 8,494,064 | 6,382,925 | 2,597,165 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 500,000 | 494,000 | 494,000 | - | 421,500 | 305,000 | 305,000 | - |
| (iv) | වෙනත් ආදායම් | 25,905,000 | 15,636,593 | 636,593 | 15,000,000 | 25,842,000 | 10,873,887 | 553,719 | 10,320,168 |
| | | 52,667,100 | 42,373,386 | 22,069,775 | 24,995,948 | 52,525,600 | 36,947,585 | 22,039,382 | 18,137,199 |

### 2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

#### (අ) වෙළඳ ස්ථාන කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | කඩ කුලී ගිවිසුම්ගත කාලය අවසන් වූ පැරණි වෙළඳ පල කඩ කාමර 13 ක ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි | කඩ කුලී ගිවිසුම්ගත කාලය අවසන් වූ කඩ සඳහා කුලී ගිවිසුම අළුත් කල යුතුය. | ගිවිසුම් කාලය අවසන් වී ඇති කඩ කාමර සඳහා ගිවිසුම් අළුත් කර ඇත. |
| (ii) | අතුරු බදු දී තිබූ පොදු වෙළඳපොල කඩ කාමරය සභාවට පවරා ගෙන ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුව නැවත බදු දීමට කටයුතු කරන ලෙස පළාත් පාලන සහකාර කොමසාරිස් 2019 මාර්තු මාසයේදී දන්වා තිබුණත් එසේ කර නොතිබුණි.තවද අංක 02 කඩ කාමරයෙහි 2019 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා රු.48,000 ක කඩ කුලිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අතුරු බදු දී තිබූ කඩ කාමරය පවරා ගෙන නැවත් බදු දීමට කටයුතු කල යුතුය. | කඩ කාමරය පවරා ගැනීමට හා ප්‍රසම්පාදනය අනුගමනය කර ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (iii) | සභාව සතු කඩ කාමර 08 කින් අයවිය යුතු හිඟ විදුලි ගාස්තුව රු.540,935 ක් විය. | සභාව සතු කඩ කාමරවලින් අයවිය යුතු විදුලි ගාස්තු මුදල් නිසි පරිදි අයකල යුතුය. | 2020 මාර්තු 31 දක්වා හිඟ විදුලි ගාස්තු අයවීම් පිළිබඳව දක්වා ඇත. |

(ආ ) විනෝද බදු
-------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ විනෝද බදු ශේෂය රු.1,085,903 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු.49,814 ක් පමණක් අයකර තිබුණි. | හිඟ ආදායම කඩිනමින් අයකර ගත යුතුය. | දීර්ඝ කාලීනව පවතින හිඟ මුදල සම්බන්ධව නඩු පවරා ඇත. |

2.3.3 මුද්දර ගාස්තු
---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.25,000,000 ක් විය. | හිඟ ආදායම අයකර ගත යුතුය. | ලැබිය යුතු මුද්දර ගාස්තු ලබා ගැනීමට අවශ්‍ය සියළු ලේඛන පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. |

3 මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 කාර්ය සාධනය
------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ක්‍රියාකාරි සැලැස්ම<br>---------------------<br>(i) ක්‍රියාකාරි සැලැස්මේ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය මැන බැලීමේ ක්‍රමවේදයක් නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්ම යටතේ ඉටු කරන ලද කාර්යයන් වල ප්‍රගතිය මැන බැලීමේ ක්‍රම වේදයක් සකස් කල යුතුය. | ප්‍රගතිය මැන බැලීමට අංශ ප්‍රධානීන් පත් කර තිබුණි. |
| (ii) අයවැය ලේඛනයෙන් භෞතික සැලසුම් හා මංමාවත් වැය යටතේ රු.මි.12 ක් වෙන් කලද , 2019 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම තුල මේ සඳහා රු.මි.19.2 ක ප්‍රතිපාදනයක් ඇතුළත් කර තිබුණි . | වාර්ෂික අයවැය ලේඛනයට අනුව ක්‍රියාකාරි සැලැස්ම සකස් කල යුතුය | පිළිතුරු ලබා දී නැත. |

(ආ) සණ අපද්‍රව්‍ය කළමනාකරණය
----------------------------------

| | | |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ එක් රුස් වන නොදිරන කුණු කසළ බැහැර කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් නොමැතිව හා එම කාර්යය භාහිර පාර්ශවයක් ලවා සිදු කිරීම නිසා 2019 වර්ෂය වෙනුවෙන් රු.43,811,000 ක් වන විශාල වියදමක් දරා තිබුණි. | කසල කළමනාකරණය විධිමත් කල යුතුය. | අවසන් කසල බැහැර කිරිමට යෝග්‍ය ස්ථානයක් නොවූ බැවින් පුද්ගලික අංශයේ ආයතනයක් මගින් අවසන් කසල බැහැර කිරීම සිදු කරනු ලබයි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක
----------------------------

| | | |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණූ ක්‍රියාත්මක කිරිම සම්බන්ධව 2019-2020 ට සංවර්ධන සැලැස්මක් සකස් කර තිබුණත් , එම සැලැස්ම තුල දරිද්‍රතාවය පිටු දැකීමේ වැඩ සටහන් ලෙස ක්‍රියාත්මක කර තිබුණේ දැනුවත් කිරීමේ වැඩ සටහන් පමණක් වන අතර ඔවුන්ගේ ජීවන තත්ත්වය නංවාලීමට , දරිද්‍රතාවය තුරන් කිරීමට දීර්ස කාලීන සැලසුමක් හෝ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. | දරිද්‍රතාවය නංවාලීමට දිළිඳු පවුල් 04 ක් වෙනුවෙන් කැඳ / කිරි ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) භාවිතයට ගත නොහැකි අත් ට්‍රැක්ටරය වෙන්දේසි කිරීමට රු.15,000 ක තක්සේරුවක් ලබාගෙන තිබුණු නමුත් වෙන්දේසි කිරීමට කටයුතු සිදු කර නොතිබුණි. | වෙන්දේසි කිරීමට නිර්දේශ කර ඇති භාණ්ඩ වෙන්දේසි කල යුතුය. | මේ සම්බන්ධයෙන් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් පරීක්ෂණ වාර්තාවක් ලබාගෙන වෙන්දේසි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) කසල අපහරණ රථය අළුත්වැඩියාව 2017 වර්ෂයේ සිට අක්‍රීයව පැවතිණි. | අළුත්වැඩියා සිදු කර පාවිච්චියට ගත යුතුය. | අළුත්වැඩියා කිරීමට නොහැකි බැවින් වෙන්දේසි කිරීමට කටයුතු සිදු කරමින් පවති. |
| (ඇ) ළමා ක්‍රීඩාංගනයේ කොටසක බාහිර පාර්ශවයක් විසින් අනවසරයෙන් පවත්වාගෙන යමින් තිබු වෙළඳ සැල ඉවත් කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | අනවසර පදිංචි කරුවන් ඉවත් කර දේපල සභාවට පවරා ගත යුතුය. | ඉවත් කිරිමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |

| | | |
|---|---|---|
| (ඈ) වැවල පෙර පාසැල පිහිටි ඉඩමෙන් භාහිර පාර්ශවයක් විසින් අනවසරයෙන් අත්පත් කරගෙන තිබූ පර්චස් 10 ක ඉඩම් කොටස ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අනවසර පදිංචි කරුවන් ඉවත් කර දේපල සභාවට පවරා ගත යුතුය. | විෂයභාර අමාත්‍යතුමාගේ ලැබෙන උපදෙස් මත කටයුතු කරන බව දන්වමි. |
| (ඉ) 1994 වර්ෂයේ සොරණවත්ත වෙන්දේසි ඉඩමෙන් පොදු පහසුකම් සඳහා සභාවට වෙන් කර ඇති රූඩ් 02 පර්චස් 06 ක ඉඩමෙන් යාබද ඉඩම්හිමියා විසින් අනවසරයෙන් අල්ලාගෙන තිබූ ඉඩම් කොටස ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අනවසරයෙන් භුක්ති විදින සභාවේ ඉඩම් කොටස සභාවට ලබාගත යුතුය. | සභා නීතීඥ මහතාගේ උපදෙස් පරිදි අනවසර පදිංචිකරු දැනුවත් කර ඇත. |
| (ඊ) නගර සභාව පරිහරණය කරන හොරණ පුස්තකාල ගොඩනැගිල්ල පිහිටි ඉඩම, හොරණ පරණ නගර සභා ගොඩනැගිල්ල හා ඉඩම, මහජන ක්‍රිඩාංගනය , ළමා ක්‍රිඩාංගනය, ළමා ක්‍රිඩාංගනය අසල පෙර පාසැල හා ගිනි නිවීමේ ඒකකය පිහිටි ඉඩම සඳහා හිමිකම් ඔප්පු නොතිබුණි. | සභාව සතු ඉඩම් සඳහා මැණුම් කටයුතු කර හිමිකම් ඔප්පු ලබාගත යුතුය. | හිමිකම් ඔප්පු ලබා ලබා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) පුරප්පාඩු වූ ලේකම් තනතුරේ වැඩ ආවරණය කිරීමට කළමනාකරණ සහකාර අධි ශ්‍රේණියේ නිලධාරිනියක් පත් කර තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කල යුතුය. | පළාත් පාලන ලේකම් (බ.ප) විසින් අදාල තනතුරට පත් කර ඇති පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බව දන්වමි. |
| (ii) අනුමත කාර්ය මණ්ඩලය තුල පැවති ආයුර්වේද වෛද්‍ය නිලධාරි තනතුරට අමතරව තාවකාලික වෛද්‍යවරයෙකු පත්කර තිබුණි. | අනුමත කාර්යය මණ්ඩලය ඉක්මවා කාර්යය මණ්ඩලය බඳවා නොගත යුතුය. | ආයුර්වේද වෛද්‍ය නිලධාරියා නිවාඩු අවස්ථා වල රාජකාරි කිරිම සඳහා තාවකාලික වෛද්‍ය වරයෙකු පත් කර ඇත. |

| | | |
|---|---|---|
| (iii) ආදායම් පරීක්ෂක , දත්ත සැකසුම් ක්‍රියාකාරි, පෙර පාසැල් ගුරු, රථ වාහන පාලිකා, වැඩ කේෂත්‍ර කම්කරු , සෞඛ්‍ය කම්කරු, ස්ථානභාර නිලධාරි හා ගිනිබට යන තනතුරු වල පුරප්පාඩු 14 ක් විය. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතුය. | පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බව |
| (ආ) අයනොවන සේවක ණය<br>------------------------------- | | |
| සේවකයින් 07 දෙනෙකුගෙන් 2020 ජුලි 31 දින වන විට අය නොවන සේවක ණය රු.201,224 ක් විය. | හිග ණය ශේෂ අයකර ගත යුතුය. | අය කර ගැනිමට කටයුතු කරන බව දන්වමි. |